casey.vic.gov.au
caseycc@casey.vic.gov.au
03 9705 5200
PO Box 1000, Narre Warren VIC 3805

TIS: 131 450
NRS (for the deaf, hearing or speech impaired):
Visit internet-relay.nrscall.gov.au

Our face-to-face Customer Service Centres are currently closed due to the impact of COVID-19.

City of Casey

# <u>සිටි ඔෆ් කේසි හි බාලාංශයට ඇතුලත් කිරීම</u>

## <u>නිතර අසන ප්‍රශ්න</u>

**මාගේ දරුවාව බාලාංශයට යැවීමට මට අවශ්‍යයි. මා විසින් කුමක් කල යුතුද?**

*ඔබගේ දරුවාව ලියාපදිංචි කිරීම සඳහා ඔන්ලයින් පෝර්ටල් (online portal) ගිණුමක් විවෘත කල හැකිය. මෙය කේසි වෙබ් අඩවියේ ඇත.*

**මාගේ පදිංචිය වෙනස් කලහොත් කුමක් සිදුවේද?**

*ඔබගේ පෝර්ටල් ගිණුම ඔස්සේ ඕනෑම අවස්ථාවක ඔබගේ තොරතුරු යාවත්කාලීන කල හැකිය.*

**මා විසින් ලබා දිය යුතු ලියකියවිලි මොනවාද?**

*උපත සනාථ කිරීම සඳහා ලියකියවිලි (පිළිගනු ලබන ලියකියවිලි අතර උප්පැන්න සහතිකය, ගමන් බලපත්‍රය, හෝ මෙඩිකෙයාර් මගින් නිකුත් කල ප්‍රතිශක්තිකරණ ඉතිහාස ලේඛණය (ඔබගේ මයිගව් (MyGov) ගිණුම වෙත යාමෙන්ද මෙයට ප්‍රවේශ විය හැකිය).*

**මාගේ දරුවා සඳහා බාලංශයේ ස්ථානයක් ලබා ගන්නේ කෙසේද?**

*ස්ථාන ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භවන්නේ, ඔබගේ දරුවා බාලාංශය වෙත යාමට නියමිත වසරට පෙර වසරේ දෙවන භාගයේදීය. සෑම ලියාපදිංචියක් සඳහාම ලකුණු සංඛ්‍යාවක් ලබාදේ. මෙම ලකුණු පදනම් වන්නේ, වැඩි ප්‍රමුඛතා දරුවන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පනවන ලද ප්‍රවේශය සඳහාවූ ප්‍රමුඛතාවයෙහි ඇති මාර්ගෝපදේශයන්ට (Priority of Access guidelines) සහ සිටි ඔෆ් කේසි මගින් පනවන ලද ප්‍රාදේශීය උපමානයන්ට අනුකූලවය.*

*සියළුම සිසුන් සඳහා ලකුණු ක්‍රමය මත පදනම්වූ අහඹු තෝරා ගැනීමක් සිදු කරනු ඇත.*

**ස්ථාන ලබාදීමක් මා විසින් පිළි ගන්නේ කෙසේද?**

*පෝර්ටල් ගිණුම ඔස්සේ දෙමාපියන් විසින් ස්ථානයක් ලබාදීම පිළිගත හැකිය.*

**මගේ දරුවා බාලාංශය වෙත යන දින සහ වේලාවල් මා විසින් දැන ගන්නේ කෙසේද?**

*ඔබගේ පෝර්ටල් ගිණුම ඔස්සේ ඔබ කැමති දින සහ වේලාවන් වසර අවසාන භාගයේදී තෝරා ගත හැක.*